# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,922 - 2015 ජූලි මස 03 වැනි සිකුරාදා - 2015.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 402 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 409 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 409 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 24 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2015 ජූලි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


401 – B 080961—352 (2015/07)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 254

MOD/DEF/2/01/ENL/03/ORC.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් බලලත් නිලධාරීන් 2014 සැප්තැම්බර් මස 26 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ ලුතිනන් (උපකරණ පාලක) කාර්මික නිලධාරීන් වශයෙන් පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට අනුව අධිකාරියට පත්කිරීම සහ එම දින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කිරීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

1. සෙ/650269 බලලත් නිලධාරි 1 ගාල්ලේ පතිරණගේ සනත් ඉඳුනිල් කුමාර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
2. සෙ/85628 බලලත් නිලධාරි 1 වෂී මන්නාඩි මානෙල් දමයන්ති සිල්වා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
3. සෙ/85785 බලලත් නිලධාරි 1 එගොඩ රාලලාගේ පද්මසිරි බණ්ඩාර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
4. සෙ/85786 බලලත් නිලධාරි 1 බටපොල ආරච්චිගේ දොන් සමන් දේවප්‍රිය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
5. සෙ/776733 බලලත් නිලධාරි 1 පොල්වත්තගේ දොන් ගොඩ්ප්‍රි සන්ධ්‍යා කුමාර සන්නද්ධ බුද්ධි බළකාය ;
6. සෙ/601218 බලලත් නිලධාරි 1 මිරිස් ආරච්චිගේ සම්පත් ප්‍රියශාන්ත, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය ;
7. සෙ/85787 බලලත් නිලධාරි 1 රංපටි ගෙදර රුක්මන් බංඩාර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
8. සෙ/775431 බලලත් නිලධාරි 1 මුදලිහාමි මුදියන්සේලාගේ ගාමිණී විජිත කුමාර දුනුවිල, සන්නද්ධ බුද්ධි බළකාය ;
9. සෙ/776146 බලලත් නිලධාරි 1 බද්දරාල රත්නායකගේ රවීන්ද්‍ර රත්නායක, සන්නද්ධ බුද්ධි බළකාය ;
10. සෙ/85558 බලලත් නිලධාරි 1 ජගමුනි සුසන්ත ද සොයිසා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
11. සෙ/576154 බලලත් නිලධාරි 1 අමරවංශ රාමනායක මුදියන්සේලාගේ වම්මික බංඩාර රාමනායක, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය ;
12. සෙ/275522 බලලත් නිලධාරි 1 තේනුවර කුමාරවංශගේ සමරසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බළකාය ;
13. සෙ/85476 බලලත් නිලධාරි 1 චින්තක ලියනගේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
14. සෙ/700509 බලලත් නිලධාරි 1 හේවා පතිරණලාගේ ගාමිණී කුලරත්න, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය ;
15. සෙ/85550 බලලත් නිලධාරි 1 එදිරිසිංහ මුදියන්සේලාගේ රෝහණ සෝමරත්න එදිරිසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ;
16. සෙ/700765 බලලත් නිලධාරි 1 අහංගමගේ රොෂාන් තිලකරත්න ද සිල්වා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය ;
17. සෙ/100655 බලලත් නිලධාරි 1 සෙනරත් රුබසිංහ යාපා, සන්නාහ සන්නද්ධ බළකාය ;
18. සෙ/775702 බලලත් නිලධාරි 1 ගනේගොඩ විදානගේ දිලුප් මලින්ද නුවන්, සන්නද්ධ බුද්ධි බළකාය ;
19. සෙ/151721 බලලත් නිලධාරි 1 කහඳ කනත්තගේ රෝහණ සමන්සිරි, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
20. සෙ/152343 බලලත් නිලධාරි 1 ගමගේ දයාරත්න, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
21. සෙ/101175 බලලත් නිලධාරි 1 හේරත් මුදියන්සේලාගේ ගාමිණී හේරත්, සන්නාහ සන්නද්ධ බළකාය.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07-85

---

2015 අංක 255

DIRF/RECT/273/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත සඳහන් කාන්තා කෙඩෙට් නිලධාරීන් පහත දක්වා ඇති දිනයන් සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

(අ) 2013.12.23 දින සිට
සී/58182 කාන්තා කෙඩෙට් නිලධාරි නවෝදා තමාරි වික්‍රමසිංහ,

(ආ) 2013.12.24 දින සිට
සී/58185 කාන්තා කෙඩෙට් නිලධාරි වන්නිආරච්චිගේ ඉෂාරා උදයංගනී වන්නිආරච්චි,

(ඇ) 2014.04.04 දින සිට
සී/58186 කාන්තා කෙඩෙට් නිලධාරි පටබැඳි මද්දුමාගේ යශෝදා කල්හාරි.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07-83

2015 අංක 256

DIRF/RECT/259/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2014 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/57268 කෙඩෙට් නිලධාරි කාශ්‍යප ස්වර්ණදේව කුමාරනායක.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී.එම්.යූ.ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07-86

---

2015 අංක 257

MOD/DEF/2/01/ENL/01/CDT

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2014.11.30 දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බලසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම සහ එදිනම සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බලකාවෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/58988 කෙනි සංගපාල ආරච්චිගේ දොන් නිරේශ් දිල්ෂාන් දිසානායක, ගැමුණු හේවා බළකාය ;
සී/58989 කෙනි කනගරත්නම් අනෝජන්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තුව ;
සී/58855 කෙනි සිංගප්පුලි ආරච්චිලාගේ සෞම්‍ය පිවිතුරු රත්නායක, ගැමුණු හේවා බළකාය ;
සී/58990 කෙනි දොන් කළිදු ප්‍රමෝද් වික්‍රමසිංහ ජයසේකර, ගජබා රෙජිමේන්තුව ;
සී/59009 කෙනි බාලා ආචාරිගේ රන්දුනු රොෂාන් වෙදගේ, විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/59010 කෙනි මීමැඩුම බඩල්ගේ චමිත් දේවින්ද, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ;
සී/58994 කෙනි කොංඩසිංහ ආභරණලාගේ සමුද්‍ර නිලුපුල් කොංඩසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය ;
සී/59011 කෙනි බුද්ගමුව මුදියන්සේලාගේ තරුක්ෂ දසුන් රිද්මික පෙරේරා, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය ;
සී/59033 කෙනි එගෝ රාලලාගේ දිනුෂක දීප මදුරංග ගුණතිලක, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව ;
සී/58995 කෙනි නවෝද් කෞශල්‍ය ඉලුක්වත්ත, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය ;
සී/59007 කෙනි අත්තනායක මුදියන්සේලාගේ ප්‍රදීප් මධුරංග අබේසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකාය ;
සී/59020 කෙනි තුයියා ගම්හේවා නිතින් කිරුළ ද සිල්වා, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/59018 කෙනි ඉම්හාමි මුදියන්සේලාගේ පියුම් මධුශංක මුදියන්සේ, ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/59008 කෙනි ඒකනායක රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ රජිත බණ්ඩාර ඒකනායක, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/58887 කෙනි මහා ආරච්චිලාගේ සුදේස් තිලංක අබේරත්න, විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/59022 කෙනි පතිරගේ තාරක ප්‍රියදර්ශණ සම්පත් පෙරේරා, ගජබා රෙජිමේන්තුව ;
සී/58993 කෙනි හේරත් මුදියන්සේලාගේ සුමේධ කුමාර ප්‍රේමරත්න, ගජබා රෙජිමේන්තුව ;
සී/58890 කෙනි පන්නල ගෙදර ගිහාන් ප්‍රසාද් ලක්මාල් පියසේන පන්නල, විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/59013 කෙනි ගජනායක මුදියන්සේලාගේ අරුණ ඉන්දික බණ්ඩාර ගජනායක, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය ;
සී/58996 කෙනි කැළුම් අරක්කලගේ පුලස්ති එඩ්වඩ් තේජාන් ප්‍රනාන්දු, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/59037 කෙනි කාලිංග මධුර කුෂාන් ද සිල්වා, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/59002 කෙනි චරිත් රන්දික සමරසිංහ, ගැමුණු හේවා බළකාය ;
සී/58885 කෙනි රඹුක්ගම නාහල්ල ආරච්චිලාගේ නවින් අසංක ඇන්ඩ්‍රයස් රඹුක්ගම, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය ;
සී/59015 කෙනි අධිෂ කෞශාන් හඳුන්මුල්ල, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ;
සී/58849 කෙනි ගල්බඩ පයාගලගේ රුචිර සමින්ද අමරජීව, ගැමුණු හේවා බළකාය ;
සී/59024 කෙනි හපුආරච්චිගේ ලක්ෂිත ඉෂාන් කරුණාරත්න, ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/59014 කෙනි මංචනායක අච්චිල්ලාගේ තුසර ෂරෝද් මංචනායක, ගජබා රෙජිමේන්තුව ;
සී/59012 කෙනි තෙන්නකෝන් මුදියන්සේලාගේ මල්විල පද්මකුමාර බණ්ඩාර තෙන්නකෝන්, විජයබාහු පාබල රෙජිමේන්තුව.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී.එම්.යූ.ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

02-84

2015 අංක 258

MOD/DEF/07/01/AVF/RET/452.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2013 ඔක්තෝබර් මස 17 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික බ්‍රිගේඩියර් ගෝනදූවගේ සිරිවර්ධන පෙරේරා (නි/2286)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2013 ඔක්තෝබර් මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් ගෝනදූවගේ සිරිවර්ධන පෙරේරා (නි/2286)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-151

---

2015 අංක 259

MOD/DEF/07/01/AVF/RET/454.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපතිඋතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2013 නොවැම්බර් මස 17 වැනි දින සිට කර්නල් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික කර්නල් මහින්ද ලක්ෂ්මන් දීගහවතුර (නි/2458)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2013 නොවැම්බර් මස 18 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් මහින්ද ලක්ෂ්මන් දීගහවතුර (නි/2458)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-150

---

2015 අංක 260

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2013 ජනවාරි මස 30 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) වශයෙන් :*

ලුතිනන් (ඒඑස්ඩබ්) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්)] කළුපහන ලියනගේ අමින්ද මහේෂ් කළුපහන, එන්ආර්එක්ස් 1732 ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) සූරිගේ ගයාන් සංජීව, එන්ආර්එක්ස් 1786, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 02 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) වැලිගම පල්ලිය ගුරුගේ බුද්ධික ජයමාල් ජයවර්ධන, එන්ආර්එක්ස් 1804, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 09 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) බෝධිනායක ගම්ලත්ගේ අනුෂ්ක ලක්රුවන් ජිනසේන, එන්ආර්එක්ස් 1773, ශ්‍රීලංනාහ

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) මාලිකාරාමගේ සදාශ්‍රී චතුරංග ගුණසේකර, එන්ආර්එක්ස් 1785, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-43/4

2015 අංක 261

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2014 පෙබරවාරි මස 08 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) [(තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ)] සැලව ගරුමුනිගේ සුපුන් කුමාර සෝමරත්න, එන්ආර්පී 1483, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

07-152/1

---

2015 අංක 262

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2014 අගෝස්තු මස 12 වැනි දින සිට ලුතිතන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ)] විජේසේකර මුදියන්සේලාගේ ඉන්දික රොහාන් අබේසේකර, එන්ආර්පී 1638, ශ්‍රීලංනාහ

*2015 පෙබරවාරි මස 15 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්:*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] රමිල් රවින්ද්‍ර හේවාපතිරණ, එන්ආර්එස් 1864 ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 16 වන දින සිට ලුතිනන් කොමණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] හේන්දදුර චමින්ද ප්‍රදීප් ද සිල්වා එන්ආර්එක්ස් 1784, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-43/2

2015 අංක 263

MOD/DEF/03/02/PRO/RNF/01/01/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2015 පෙබරවාරි මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (එස්ඩීඕ) වශයෙන් :*

ලුතිනන් (එස්ඩීඕ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (එස්ඩීඕ)] මීවල ආරච්චිලාගේ චන්දන පද්මල් අබේවර්ධන, එන්ආර්එක්ස් 1801, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

07-152/2

---

2015 අංක 264

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2015 මාර්තු මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) දේවයලාගේ රවින්ද්‍ර ඉන්දික විමලරත්න, එන්ආර්එක්ස් 2218, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] දිල්ශාන් විජේනාත එන්ආර්ඊ 2234, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

07-152/4

2015 අංක 265

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2015 මාර්තු මස 12 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) ඉදිරිමුනි දමිත් සොයිසා දිසානායක, එන්ආර්එක්ස් 1754, ශ්‍රීලංනාහ
ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) අල්ගේවත්තගේ අසංක චමීර ද සිල්වා එන්ආර්එක්ස් 1780, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 12 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සංඥා) වශයෙන් :*

ලුතිනන් (සංඥා) [(තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සංඥා)] දේවතන්ත්‍රිගේ සුමුදු සංක තන්ත්‍රිසේකර, එන්ආර්එක්ස් 1774, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-43/5

2015 අංක 266

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2015 මාර්තු මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (අවි) වශයෙන්:*

ලුතිනන් (අවි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (අවි)] වලිසුන්දර මුදියන්සේලාගේ ධනුක නවින්ද රත්නායක, එන්ආර්එක්ස් 1755, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-43/3

2015 අංක 267

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 මාර්තු මස 05 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) ගම්ලත් රාල්ලාගේ ධම්මික සේනාධීර ගම්ලත්, එන්ආර්ඊ 2332, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 12 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් මැණික් හවඩි විදානගේ සුජාන් දුලංජන මැණික්ගේ, එන්ආර්එක්ස් 2341, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දීය.

07-152/3

2015 අංක 268

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 මාර්තු මස 26 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් ඉරාන් චතුරංග වික්‍රමරත්න, එන්ආර්එක්ස් 2339, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-152/5

2015 අංක 269

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 මාර්තු මස 26 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් සකලසූරිය මුදියන්සේලාගේ මංජුල ලසන්ත බණ්ඩාර සකලසූරිය, එන්ආර්එක්ස් 2342, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-43/6

2015 අංක 270

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 අප්‍රේල් මස 18 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) ෆ්‍රැන්සිස්කු හෙට්ටිගේ ලලින්ද සිල්වා, එන්ආර්එස් 2270, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-43/1

2015 අංක 271

MOD/DEF/03/02/PRO/RNF/01/04/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 අප්‍රේල් මස 25 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) මුදියන්සේලාගේ ශානක මධුමාල් පෙරේරා, එන්ආර්පී 2261, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් සුභ පණ්ඩිත මුදියන්සේලාගේ නලින් ජයතිලක, එන්ආර්එක්ස් 2337, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07-152/6

2015 අංක 272

D/RF/828/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්

2015 ජූලි මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා හට ශ්‍රී ලංකා නාවික හමුද නිත්‍ය බලකායේ නිත්‍ය අධිකාරිය පිරිනැමීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (සිඉ) උඩුගම කෝරාළලාගේ දෙන් නිමේෂ් චින්තන රණතුංග, එන්ආර්සී 2866, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07-280

2015 අංක 273

MOD/DEF/03/02/RES/161.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2015 අප්‍රේල් මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය නාවික බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

උප ලුතිනන් (සැ) රජිත ලක්රුවන් එදිරිසූරිය, එන්ආර්එස් 3531, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඞී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

07-281

---

2015 අංක 274

MOD/DEF/03/02/PRO/UNF/01(i).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වෙච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2014 නොවැම්බර් මස 27 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිනන් (ස්වේ) මහතෙල්ගේ නුරාන් චාමින්ද පීරිස්, එන්වීඑක්ස් 5353, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඞී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

07-283

2015 අංක 275

MOD/DEF/03/02/VNF/COM.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වෙච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2015 ජනවාරි මස 16 වැනි දින සිට සිවිල් ඉංජිනේරු ලුතිනන් (ස්වෙච්ඡා) වශයෙන් :*

1. බුද්ධිනි ශෂිකා විජේසිංහ, එන්වීසී 5810, ශ්‍රීලංස්වේනාහ
2. පුනිදකුමාර් ගෞතමන්, එන්වීසී 5811, ශ්‍රීලංස්වේනාහ

*2015 ජනවාරි මස 16 වැනි දින සිට විධායක අංශයේ වැඩ බලන උප ලුතිනන් (ස්වෙච්ඡා) වශයෙන්*

1. රත්නායක මුදියන්සේලාගේ නුවන් බුද්ධික රත්නායක, එන්වීඑක්ස් 5812 ශ්‍රීලංස්වේනාහ ;
2. ඉලංකෝන් ආරච්චිගේ හේමාදි නිලුක්ෂි කරුණාරත්න, එන්වීඑක්ස් 5813 ශ්‍රීලංස්වේනාහ ;
3. රත්නුලු තරංග ද සොයිසා, එන්වීඑක්ස් 5814 ශ්‍රීලංස්වේනාහ ;
4. දිසානායක මුදියන්සේලාගේ තීක්ෂණ සුජීවානන්ද දිසානායක, එන්වීඑක්ස් 5815 ශ්‍රීලංස්වේනාහ ;
5. දෙල්ඹලුව ගමරාලලාගේ කසුන් මධුසංඛ චන්ද්‍රදස, එන්වීඑක්ස් 5816 ශ්‍රීලංස්වේනාහ ;
6. රණසිංහ ආරච්චිගේ ඉරේෂා මධුෂානි, එන්වීඑක්ස් 5817 ශ්‍රීලංස්වේනාහ ;
7. සෙයියදු මුහම්මදු බුහාරි මුහම්මදු අස්සාම්, එන්වීඑක්ස් 5818 ශ්‍රීලංස්වේනාහ ;
8. කරුණාසිරි වික්‍රමසූරියගේ චතුර සාලිංග මුනසිංහ, එන්වීඑක්ස් 5819 ශ්‍රීලංස්වේනාහ ;
9. මල්පෝරු මුදින්සේලාගේ දෙන් සුජීවනි පුෂ්පකුමාරි, එන්වීඑක්ස් 5820 ශ්‍රීලංස්වේනාහ ;
10. ජයකොඩිගේ කළණ ජයනන්ද, එන්වීඑක්ස් 5821 ශ්‍රීලංස්වේනාහ ;
11. සචින්තනා ලොකුවත්තගේ, එන්වීඑක්ස් 5832 ශ්‍රීලංස්වේනාහ ;
12. අසරප්පුලිගේ ශානිකා චතුරංගී, එන්වීඑක්ස් 5823 ශ්‍රීලංස්වේනාහ ;
13. තලවින්නේ ගෙදර ඉන්දික ප්‍රභාත් අමරනායක, එන්වීඑක්ස් 5824 ශ්‍රීලංස්වේනාහ ;
14. කුඩාරාල ලේකම්ලාගේ නිලූකා ප්‍රියදර්ශනී, එන්වීඑක්ස් 5825 ශ්‍රීලංස්වේනාහ ;
15. බෙන්තරගේ අරුණි නදීෂා දයන්තිනන්ද, එන්වීඑක්ස් 5826 ශ්‍රීලංස්වේනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඞී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

07-284

2015 අංක 276

MOD/DEF/03/02/VNF/TRN/49.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වෙච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ස්වෙච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

2015 මැයි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුද ස්වෙච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත

ලුතිනන් (ස්වේ) උඩුවගේ දොන් අර්ල් බර්නාඩ් අබේරත්න, එන්වීඑක්ස් 5457, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

07-282

# රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥපනත**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ 2015 වාර්ෂික ඇසළ උත්සවය ජූලි මස 25 වැනි සෙනසුරාද දින සිට අගෝස්තු මස 07 වැනි සිකුරාද දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥපනතේ (175 වැනි පරිච්ඡේදය) රෙගුලාසිවල 10 වන වගන්තිය අනුව 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද අංක 11959 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය යටතේ මෙයින් දන්වමි.

ඊ. ඒ. සී. විදානගමාච්චි,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති.
මාතර.

2015 ජූනි මස 10 වැනි දින,
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-46

**ඔඩ්ඩුසුඩ්ඩාන් තාන්තෝන්රීස්වරර් කෝවිල් උත්සවය - 2015**

මුලතිව් දිස්ත්‍රික්කය

ඉහත සඳහන් උත්සවය 2015 ජූනි මස 16 වැනි දින පෙ. ව. 6.00ට පටන්ගෙන 2015 ජූලි මස 07 වැනි දින ප. ව. 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

ආර්. කේතීස්වරන් මිය,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2015 ජූනි මස 10 වැනි දින,

07-44

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව**
**(යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.12.13 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් හා ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව : කුරුඳුවත්ත.
ගිණුම් අංකය : 0320-01402391-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක : පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ස්වාමිනාදන් විසින් සහතික කරන ලද 2005 මාර්තු 28 දිනැති අංක 6355 සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී. පෙරේරා විසින් සහතික කරන ලද 2006 අගෝස්තු මස 03 දිනැති අංක 169 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 07 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක පීබී 858 පීකිව් දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (කලින් ලියා පදිංචි අංක : පීවීඑස්/පීබීඑස් 2402 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සෙන්ට්‍රල් ඉන්ස්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ් නමින් හඳුන්වන ලද) සෙන්ට්‍රල් ඉන්ස්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්කෝටි තිස්පන් ලක්ෂ විසිහය දහස් හත්සිය විසි තුනයි ශත අසූහතරක (රු33,526,723.84) මුදලක්, 2013 අගෝස්තු 30 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 33,526,723.84 මුදලද, 2013 අගෝස්තු 31 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විස්සයි දශම පහයි බිංදුව (20.50%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 6355 සහ 169 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරි ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ වෝඩ් අංක 24 (සුදුවැල්ල) පිහිටි බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 1993.01.31 දිනැති අංක 4274 මිනුම් සැලැස්මේ සඳහන් ලොට් ඒ 1 ලකුණු කළ ධර්මපාල මාවත වරිපනම් අංක 181 (කොටසක්) දරන (බලයලත් මිනින්දෝරු එච්. ඩී. ඩේවිඩ් විසින් සාදන ලද 1986.01.06 දිනැති අංක 2268 සැලැස්මේ සඳහන් ලොට් ඒ හි අතුරු බෙදීමක් වන) සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : ධර්මපාල මාවත වරිපනම් අංක 185/1, 185 1-1/1 දරන පරිශ්‍රයන් සහ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ ඒ 2 ද, දකුණට : ලොට් ඒ 2 සහ ධර්මපාල මාවත වරිපනම් අංක 177 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : ධර්මපාල මාවත වරිපනම් අංක 177 සහ 185/1 සහ 185/1-1/1 දරන පරිශ්‍රයන් ද යන මායිම් තුළ එකී අංක 4274 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම බිංදුවයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.05) විශාල, ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 862/145 හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ

පෙර කී ධර්මපාල මාවත පිහිටි පෙර කී අංක 4274 සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලකුණු කල (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කිරීම) සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : පාර සහ ධර්මපාල මාවත වරිපම් අංක 185/3 සහ 191 දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට : වරිපනම් අංක 191 දරන පරිශ්‍රය සහ ධර්මපාල මාවත ද, දකුණට : ධර්මපාල මාවත, ලොට් ඒ 1 සහ ඒ 2 සහ ධර්මපාල මාවත වරිපනම් අංක 185/1 සහ 185 1-1 /1 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : ලොට්ස් ඒ1 සහ ඒ2, ධර්මපාල මාවත, වරිපනම් 185/1 සහ 185/1-1/1 දරන පරිශ්‍රයන් පාරක් සහ ධර්මපාල මාවත වරිපනම් අංක 185/3 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ එකී අංක 4274 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 13.56) විශාල, ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 862/146 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මෙය, සහකාර සාමාන්‍යාධිකාරිනි - නීති

07-80

---

පීවී 9693.

### 2007 අංක 07 දරන සමාගම් පනත

### 394 (3) වගන්තිය යටතේ "සිනමන් එසෙන්සල් ඔයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1999.02.15 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සිනමන් එසෙන්සල් ඔයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සිනමන් එසෙන්සල් ඔයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
*(රාජකාරි ඉටුකිරීම).*

2015 මැයි මස 30 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-190

---

### මහජන බැංකුව - අම්බලන්ගොඩ (35)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.04.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල නීතිඥ සහ ප්‍රසිද්ධ නොතරිස් අජන්තා කපුගමගේ විසින් 2013.11.27 සහතික කරන ලද අංක 9074 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, 01. උත්තමාවඩු කල්‍යාණසිරි, 02. උත්තමාවඩු ඉෂාන් මධුසංඛ කල්‍යාණ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට

රුපියල් හතලිස් දෙලක්ෂ හතලිස් අට දහස් හයසිය හැට හයයි ශත හැට නමය (රු. 42,48,666.69) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2014.10.24 දින සිට වර්ෂයකට 19% බැගින් රුපියල් හතලිස් දෙලක්ෂ හතලිස් අට දහස් හයසිය හැට හයයි ශත හැට නමය (රු. 42,48,666.69) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හතලිස් දෙලක්ෂ හතලිස් අට දහස් හයසිය හැට හයයි ශත හැට නමය (රු. 42,48,666.69) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 9074 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බලන්ගොඩ නගර සභා සීමාවේ 85 - පටබැඳිමුල්ල ග්‍රාම සේවා වසමේ පිහිටි අන්දිගේවත්ත දකුණු කැබැල්ලෙන් කැබලි අංක 2 සහ අන්දිගෙවත්ත කැබලි අංක 1 ඒකාබද්ධ ඉඩමට, බලයලත් මානක පී. එච්. ඩී. සිල්වා මහතාගේ 138ඒ සහ 1993.10.16 දින දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක ඒ ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 3 ද, බස්නාහිරට : තුඩුවගේ සයිමන් පදිංචිවවුන් වත්ත ද යන සතර මායිම් තුළ පිහිටි අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි, පර්චස් පහළවයි, දශම දෙකයි හත (අ. 0. රූ. 0, පර්. 15.27) ක් විශාල ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේ ද වේ.

මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 253/182 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

07-258

---

### මහජන බැංකුව - හෝමාගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.19 දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද 2008.05.08 දිනැති අංක 3198 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පෝරගේ ලක්ෂ්මන් අනුර ගීතදේව මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හයලක්ෂ අනූ හතර දහස් තුන්සිය අනූ හතයි ශත තිස් එකක (රු. 6,94,397.31) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.08.27 දින සිට වර්ෂයකට සියයට විසිතුන බැගින් (23%) හා රුපියල් හයලක්ෂ අනූ හතර දහස් තුන්සිය අනූ හතයි ශත තිස් එක (රු. 6,94,397.31) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ අනූ හතර දහස් තුන්සිය අනූ හතයි ශත තිස් එකක් (රු. 6,94,397.31) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 3198 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, කිරිගම්පමුණුවේ යන ගම පිහිටි ''ගලගාවාහේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. එල්. එන්. ටී. චන්ද්‍රන මහතා විසින් 2007.01.06 වන දින මැන සාදන ලද අංක 3639 දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කළ ලොට් අංක 1B දරන කොටසට මායිම්, උතුරට : හෙන්රි ප්‍රනාන්දුට අයිති ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එච්. පී. රත්නපාලට අයිති ඉඩම ද, බස්නාහිරට : පී. ඩී. ජයතිලකට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිපහයි දශම හයයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 25.60) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම උකස්කරය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N389/91 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කළාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත,
මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07-259

---

### මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2015.04.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් මහත්මිය විසින් 2014.01.24 දින ලියා සහතික කරන ලද අංක 5573 සහ 5575 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, චන්ද්‍ර මරක්කලගේ ඇන්ටන් නවීන් චමින්ද සිල්වා සහ දෝන රුවන්ති ශිරෝමාලා රන්දෙනි (කාඩිනල් ඇක්වාටෙක්) යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී අංක 5573 උකස්කරය යටතේ රුපියල් මිලියන තුන (රු. 3,000,000) ක මුදලක් සහ අංක 5575 උකස්කරය යටතේ රුපියල් දහතර ලක්ෂ අසූ දෙදහස් හත්සිය පනහයි ශත තිස් පහ (රු. 14,82,750.35) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2014.07.01 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් මිලියන තුන (රු. 3,000,000) ක මුදලක් සහ 2015.01.23 දින සිට වර්ෂයකට 19% බැගින් රුපියල් දහතර ලක්ෂ අසූ දෙදහස් හත්සිය පනහයි ශත තිස්පහ (රු. 14,82,750.35) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් මිලියන තුන (රු. 3,000,000) ක මුදල සහ රුපියල් දහතර ලක්ෂ අසූ දෙදහස් හත්සිය පනහයි ශත තිස් පහ (රු. 14,82,750.35) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 5573 සහ අංක 5575 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

මෙම පහසුකම්වලට අමතරව ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් මහත්මිය විසින් 2013.09.25 දින ලියා සහතික කරන ලද අංක 5198 දරන උකස්කරය යටතේ ඉහත ණයකරු වෙත පහත දේපල මතම ප්‍රදනිත රුපියල් මිලියන 4.1ක ණය මුදල රු. 32,76,000.03 ක ශේෂයක් සහිතව ක්‍රමිකව පවත්වාගෙන යයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කොච්චිකඩේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මීගමුව නගර සභා සීමාවේ පලඟතුරේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි ප්ලසන්ට් විලා නමැති ඉඩමට බලයලත් මානක වයි. එම්. ආර්. යාපා මහතා විසින් 2012.11.22 වැනි දින මැන සාදන ලද අංක 11345A දරන පිඹුරේ ලොට් 2A දරන කොටසට මායිම්, උතුරට : බලයලත් මානක එම්. ඩී. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 5870 පිඹුරේ ලොට් 2 සහ ලොට් 3A ද, නැගෙනහිරට : එම්. ඩී. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරුවරයාගේ අංක 5870 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 3A සහ අඩි 15ක් පළල මාර්ගය සඳහා වෙන් කර ඇති බිම් කොටස (පිඹුරු අංක 11345හි ලොට් අංක 4) සහ පිඹුරු අංක 11345හි සඳහන් ලොට් අංක 3 ද, දකුණට : පාර සහ අංක 12894 පිඹුරේ සඳහන් ලොට් අංක 1 ද, බටහිරට : පිඹුරු අංක 11345හි සඳහන් ලොට් අංක 1 සහ අංක 12894 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 1 යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහහතයි දශම එක (අ. 0, රූ. 1, පර්. 17.1) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක G46/103 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස්හි මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

07-260

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.03.26 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0130-02014797-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් දෙකම සහතික කරන ලද සහ දෙකම 2012 නොවැම්බර් මස 19 දිනැති අංක 2740 සහ 2741 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මීගමුවෙහි සිය ලියාපදිංචි අංක පීවී 9624 ඇති 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන විහිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ මීගමුව පදිංචි හන්දුන් හර්ෂ ප්‍රභාත් ද සිල්වා යන අය බන්ධනදයින් වශයෙන් අයිරා අණකර, වාර ණය 1 සහ වාර ණය 2 පහසුකම් වශයෙන් රුපියල් හයකෝටි තිස්තුන් ලක්ෂ අටදහස් නවසිය හැටනවයයි ශත විස්සක (රු. 63,308,969.20) මුදලක්, 2014 දෙසැම්බර් 17 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී අයිරා අණකර මත රු. 38,550,352.78 වාර ණය 1 මත රු. 13,451,698.60 සහ වාර ණය 2 මත රු. 11,306,917.82 මුදල ද, 2014 දෙසැම්බර් 18 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට පිළිවෙලින් සියයට විසි එක (21%) වර්ෂයකට සියයට විසි එකක (21%) සහ වර්ෂයකට සියයට දහඅටයි දශම පහක (18.5%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2740 සහ 2741 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාරිනි චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය

අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2009.09.14 දිනැති අංක 6392 සැලැස්මේ නිරූපනය වන ගිරිඋල්ල පාර වරිපනම් අංක 363 සහ 367/1 දරන දවටගහවත්ත සහ මාවතගහවත්ත හෙවත් දවටගහවත්ත නමැති බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : පාර (මහා මාර්ගය) සහ බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1645 සැලැස්මේ ලොට් 2 ද, දකුණු-නැගෙනහිරට : එකී අංක 1645 දරන සැලැස්මේ ලොට් 2 සහ පාර (මහා මාර්ගය) ද, දකුණු-බස්නාහිරට : එස්. රණසිංහගේ ඉඩම සහ උතුරු-බස්නාහිරට : එස්. ඒ. ඩී. මේබල් ද සිල්වාගේ ඉඩම යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම එකයි පහක් (අ. 0, රූ. 1, පර්. 38.15) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2011.12.27 දිනැති අංක 6962/1 සැලැස්මේ නිරූපනය වන ගිරිඋල්ල පාර වරිපනම් අංක 365 දරන දවටගහවත්ත නමැති බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : පාර (පී. එස්.) ද, දකුණු-නැගෙනහිරට : පාර (මහා මාර්ගය) ද, දකුණු-බස්නාහිරට : හර්ෂ ද සිල්වාගේ ඉඩම් සහ උතුරු-බස්නාහිරට : හර්ෂ ද සිල්වාගේ ඉඩම යන මායිම් තුළ පර්චස් විස්සයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 20.65) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

07-268

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| ජූලි | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2015.08.07 | සිකුරාදා | 2015.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.14 | සිකුරාදා | 2015.07.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.08.21 | සිකුරාදා | 2015.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.28 | සිකුරාදා | 2015.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2015.09.04 | සිකුරාදා | 2015.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.11 | සිකුරාදා | 2015.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.18 | සිකුරාදා | 2015.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.25 | සිකුරාදා | 2015.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.